**කිලිනොච්චිය දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 10 - 2023**

**------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10ට අදාළ 2023 වර්ෂයේ නිකුත් කර තිබුණු විගණන වාර්තා 10 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර එ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06ක ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීමෙන් ජංගම නොවන වත්කම්වල අගය අඩුවෙන් දක්වා තිබුණි. | ගොඩනැගිලි තක්සේරු කර ඇත. ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරනු ලැබේ. ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීම් ලැබීමෙන් පසු නිවැරදි කරනු ලබන බව. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |
| (ආ) | අක්කරායන්කුලම් ගොවිජන සේවා කාරක සභාවේ පොත්වලට අනුව ජංගම නොවන වත්කම්වල ශේෂය රු. 10,180,332ක් වුවත්, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.10,731,900ක් වශයෙන් රු.551,568ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙවැනි දෝෂ ඉදිරි කාලයේදී සිදුනොවී පැවැතීමට ගොවිජන සංවර්ධන නිලධාරිට උපදෙස් ලබාදී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04ක 2023 දෙසැම්බර් 31 දිනට පැවැති හිඟහිටි අක්කර බදු රු. 1,367,780ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට ගොවිජන සංවර්ධන නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව. | - එම - |
| (ඈ) | 1981 ඔක්තෝබර් 16 දිනැති ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයාගේ අංක 107 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා 05ක සමාලෝචිත වර්ෂයේ ට්‍රැක්ටර් සඳහා ක්ෂය කිරීම් සිදුකර නොතිබුණි. | ට්‍රැක්ටර්වල හිමිකාරිත්වය මාරුකිරීම් සිදුකිරීමෙන් පසු ක්ෂය කරනු ලබන බව. | - එම - |
| (ඉ) | පරන්තන් ගොවිජන සේවා කාරක සභාවේ සමාලොචිත වර්ෂයේ ගොවීන්ට බෙදාදී නොතිබූ ගබඩාවේ පැවැති මෙට්‍රික් ටොන් 45.16ක සහනාධාර පොහොර තොගයේ | තොග ගිණුමේ දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කරනු ලබන බව. | - එම - |

වටිනාකම රු.7,873,849ත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.3.2 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 05ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ එකතුව රු.13,738,372 ක ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට නොලැබීමෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමේ කමිටු ස්ථාපිත කර කමිටුවේ නිර්දේශ ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කළයුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2020 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| | (i) 44(1) වගන්තිය | සෑම ගොවිජන කාරක සභාවකම ගිණුම් කොමසාරිස් ජනරාල් වරයා විසින් හෝ බලය පැවරූ නිලධාරියෙකු විසින් පරීක්ෂා කළයුතු බව සඳහන් වුවත්, ගොවිජන සේවා කාරක සභා 10ක් ගිණුම් එසේ පරීක්ෂා කර නොතිබුණි. | ගොවිජන සංවිධානවල ගිණුම් පරීක්ෂා කිරීමට පියවර ගනු ලබන බව. | පනත ප්‍රකාරව පියවර ගතයුතුය. |
| | (ii) 52 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 09ක ගොවිජන සංවර්ධන ප්‍රදේශ සඳහා කෘෂි සැලැස්මක් සකස් කර නොතිබුණි. | වෙන් වෙන්ව කෘෂි සැලැසුම් සකස් කරනු ලබන බව. | -එම- |
| | (iii) 53 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 06ක කුඹුරු ඉඩම් ලේඛන සකස් කර නොතිබුණි. | ලේඛන සකස් කිරීමට පියවර ගනු ලබන බව. | -එම- |
| | (iv) 55 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 09ක අධිකාරි බලප්‍රදේශයේ පවතින කුඹුරු ඉඩම් මැනීමට පියවර ගෙන නොතිබුණි. | මැනීම් කටයුතු සිදු කරමින් බවතින බව. | -එම- |
| | (v) 56(i) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 09ක අක්කර බදු ලේඛන පවත්වා නොතිබුණි. | අක්කර බදු ලේඛන යාවත් කාලීන කර පවත්වනු ලබන බව. ෙ | -එම- |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 502(2) | ගොවිජන සේවා කාරක සභා 06ක ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඒවා භෞතිකවද පරීක්ෂා කර නොතිබුණි. | කාරක සභා 06ක ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ - II කොටසේ 9.1 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 02ක් විසින් මුදල්, චෙක්පත් හා ගබඩා භාර කටයුතුවල නිරත නිලධාරීන්ගෙන් ඇප මුදල් පසුගිය වර්ෂ 04ක සිට ලබාගෙන නොතිබුණි. | ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 10ක මෙහෙයුම් ප්‍රතිඵල රු.9,056,225 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,721,359 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලවල රු.12,665,134ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උරුත්තිරපුරම් ගොවිජන සේවා කාරක සභාවේ 2019 සැප්තැම්බර් 28 දින සිට කල් ඉකුත් වූ රු.301,350ක් වූ සංස්ථා ද්‍රාවණ පොහොර සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කල් ඉකුත් වූ තොග කපාහැරීමට කටයුතු කරමින් පවතින බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා කල් ඉකුත් වූ ද්‍රාවණ පොහොර සම්න්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 06ක් සඳහා විවිධ අමාත්‍යාංශ හා වැඩසටහන් මගින් 2010 හා 2011 වර්ෂවල ලැබී තිබූ ට්‍රැක්ටර් 76ක් අළුත්වැඩියා කිරීමට පියවර ගැනීමෙන් තොරව වර්ෂ 13ක සිට වාහන අංගනයේ නවතා තිබුණි. | අළුත්වැඩියා කළහැකි ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීමටත්, අභාවිත ට්‍රැක්ටර් වෙන්දේසියේ විකිණීමටත් කටයුතු කරමින් පවතින බව. | වත්කම් උපයෝජනය කිරීමට හෝ විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනැති අංක 02/2020 දරන ගොවිජන සංවර්ධන චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන කාරක සභා 10 සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා පියවර ගනු ලබන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව, තිරසාර සංවර්ධන අරමුණු (2030 වර්ෂයේ) ළඟාකර ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා විසින් වාර්ෂිකව ඉටුකළ යුතු ඉලක්ක, එම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළයුතු දෑ සහ එහි ප්‍රගතිය මැනීමේ දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරිමට පියවර ගනු ලබන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව සුදුසු දර්ශක හඳුනාගෙන වාර්ෂික ප්‍රගතිය මැනීමට කටයුතු කළ යුතුය. |

**5.** **ගොවිජන බැංකු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන කාරක සභා 05ක් විසින් 2021/2022 කාලපරිච්ඡේදයේ ගොවීන් 84කට ලබාදුන් රු.4,388,893 ක් වටිනා කෘෂි ණය සහ එහි පොලී රු.400,744ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයකර ගෙන නොතිබුණි. | ණය මුදල් සහ පොලී අයකර ගැනීමට ගොවිජන සමථ මණ්ඩලය මාර්ගයෙන් පියවර ගනිමින් පවතින බව. | හිඟමුදල් නියමිත කාල වකවානුවල අයකර ගැනීමට පියවර ගතයුතුය. |